## 2017 අගෝස්තු මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

## "මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්න "

(ශු.ජොහාන් 2:5)

මේ කාල වකවානුව තුළ අයැදීමේ සහ මැදිහත් වීමේ සේවකයන් වශයෙන් අපට අයැදීමට සහ මැදිහත් වීමට කරුණු කාරණා බොහොමයක් ඇත. ශුද්ධාත්මයාණන්ට අපි අවදි වන තරමට ප්‍රශ්න සහ ගැටළු බොහොමයක් අප පවුල, අප මීසම, අප ගම, අප සංඝය, මහා පුබුදුව, ශුද්ධවූ සභාව, රට තුළ වරින් වර දෝලනය වෙමින් පවතින බව දකින්නට ලැබෙයි. යක්ෂයා ඉතාමත් සියුම් ලෙස බේද කිරීමේ ආත්මය අප අතර වැපිරීමට යුහුසුළු වන බව අපට මනාව පැහැදිලි ය. ඊට අපි කලබල විය යුතු නැත. මන්ද මරණය ජය ගත් උත්ථාන වූ ජේසු ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් නිරන්තරයෙන් මැදිහත්කම් කරන බැවිනි. එමෙන්ම ශුද්ධාත්මයාණෝ - භාග්‍යවන්ත අම්මා ඇතුළු සියළු ශුද්ධවන්තයින් අප වෙනුවෙන් නිරන්තරයෙන්ම සමිඳාණන් ඉදිරියේ පෙනී සිටින අතර, විශේෂයෙන් අප සිරිලක් සාන්තුවරයා වන ශුද්ධවූ ජුසේ වාස් මුනිතුමා අප සමඟම සිටින බැවිනි.

එම නිසා අප තුළ , අප රට තුළ පවතින භේද බින්නතා, පාලකයන්ගේ අඳුරදර්ශි ක්‍රියා මාර්ග, සොරකම්, වංචා දූෂණ වලට නිසි ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වීම, පොලිතින්, ප්ලාස්ටික් ආදි කැළි කසල තැන් තැන්වල ගොඩ ගැසීමේ ප්‍රශ්න, ඩෙංගු මදුරුවන් බෝවීම් නිසා ඇතිවන ජීවිත හානි, වස විෂ සහිත ආහාර, කෘමි නාශක ගැසූ එළවළු, පලතුරු නිසා ඇති වී ඇති පිලිකා, වකුගඩු රෝගාබාධ, දැඩි නියඟය, ගංවතුර, පිරිසිදු ජලය නොමැති වීම, ගස් කොළන් කැපීම නිසා ජල උල්පත් සිඳීයාම, සමේ රෝග, පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇතිවීමේ ප්‍රශ්නය, රජයේ රෝහල්වල නිසි ප්‍රතිකාර සහ බෙහෙත් හිඟවීම, දිළිඳු බව, ජංගම දුරකථන සහ රූපවාහිනී මාධ්‍යය තුළින් විකාශනය වන අසැබි පහත් රූප රාමු, ටියුෂන් කඩ, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවලින් අය කරන අධික ගාස්තු, අයි.එස්.එස්. වැනි ත්‍රස්ත සංවිධාන, ප්‍රධාන ආගම්වල ධර්මයේ නොපිහිටා කෙරෙන භක්ති අභ්‍යාස ආදී මෙකී නොකී සියලු දේ තුළින් ජනතාවගේ අධ්‍යාත්මය පිරිහී ඇත.

එම නිසා මේ අඳුරට විරුද්ධව අපි විශ්වාසයේ පහන් දල්වමු. සමිඳාණන් අභියස අඛණ්ඩව හැඬීමෙන් ද කඳුළු සැලීමෙන් ද යාච්ඤා කරමු.

> **"එබැවින් අහස් මඬල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයකු අපට සිටින බැවින්, අප ඇදහිල්ලෙහි නොසෙල්වී පවතිමු. මන්ද, අපට ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයෙකු නොව, හැම අයුරින්ම අප වගේ පරික්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි. එබැවින් අපි අපේ අවශ්‍යතාවයන් හීදී අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැතිව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු."** (හෙබ්‍රෙව් 4:14-16)

එදා කානාන් නුවර මඟුල් ගෙදරදී මිදිරස මදි වී පැමිණි අමුත්තන්ට සංග්‍රහ කිරීමට අපහසු වී ලජ්ජාවට පත්වූ නිවැසියන් අස්වසාලීමට පෙරමුණ ගත් භාග්‍යවන්ත අම්මා, එනම්, මරිය තුමිය තම පුතණුවන්ගේ සහය පතා ඔවුන් වහන්සේගේ මැදිහත් වීම තුළ ජලය මිදිරසට හැරවීමේ ප්‍රාතිහාර්ය මෙන් අපි මේ මාසය පුරාවටම භාග්‍යවන්ත අම්මාගේ මැදිහත්කම තුළ විශ්වාසයේ පියවරවල් ගැනීමට ඉදිරිපත් වෙමු.

ශාන්ත මරියනි, දේව මෑණියෙනි, පාපි වූ අප උදෙසා දැනුත් අපේ මරණ වෙලේදීත් යාච්ඤා කළ මැනව!

**පළමු සතිය** - දිව්‍යමය කියවීම - ශු. ජොහන් 2:1-12

**අයැදීමට විශේෂ යොමුව**:

මෙම කාල පරාසය අප පවුල, අප මීසම, අප සංඝය, සභාව, රට තුළ පවතින සියලුම ප්‍රශ්නයන් වෙනුවෙන් හඬ නඟා මොරගසා, කඳුළු සලමින් යාච්ඤා කරන්න. (විනාඩි 10 ක් පමණ) අවසානයේ නපුරාට අණ කිරීමේ යාච්ඤාවට ඇතුළු වන්න.

**වෙනත් අයැදීම්:**

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව , සහයක එකතුව, සුසමථ එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියලු දෙනා වෙනුවෙන්
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* වෙනත් අයැදීම්....

**දෙවන සතිය** - දිව්‍යමය කියවීම - හෙබ්‍රෙව් 5:7-10

**අයැදීමට විශේෂ යොමුව:**

2022 දී ශ්‍රී ලංකා පුබුදුවට අවුරුදු 50 ක් සපිරෙන බැවින් මේ කාල සීමාව තුළදී ජාතික දිවැසි එකතුවෙන් අපට මඟපෙන්වා ඇති මනස්ථාපනයේ පියවරවල් වලට සියලු ජනතාවට ඇතුළු වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා අයදිමු.

* අප සිටින තැනින් සිටිය යුතු තැනට හැරීම. පුබුදු කැරිස්මාවේ අත්දැකීම් 4 ට වුවමනාවෙන්ම ඇතුළු වීම
* ශු. ජුසේ වාස් මුනිතුමන්ගේ දූතමෙහෙවර අනුව ක්‍රිස්තුදානයට යොමු වීම
* ක්‍රිස්තුදාන කථා මාලාවල් ආරම්භ කිරීම
* මෙම වසරේ තේමාව තුළ ජීවත් වීම)

**වෙනත් අයැදීම්:**

* අගෝස්තු 11,12,13,14,15 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන භාග්‍යවන්ත මාතාවන් සහ සක්‍රමේන්තු පිළිබඳ ඥනකාන්තිය වෙනුවෙන්
* අගෝස්තු 26,27 පැවැත්වෙන වගකීම් ගන්නා සුමැදි මව්වරුන්ගේ ඥානකාන්තිය වෙනුවෙන්
* අගොස්තු 29 වන දින පැවැත්වෙන ශිෂ්‍ය පුතාලගේ දිනය වෙනුවෙන්
* වෙනත් අයැදීම්

**තෙවන සතිය - දිව්‍යමය කියවීම** - 2017 ජූලි මස සුදතුම් ගමන සඟරාවේ, ස්වාමි තාත්තාගේ යාච්ඤාවට අත්වැලක් ලිපිය සහ පසු පිටේ 'කවරයේ කථාව' මඟ පෙන්වීමට ඇතුළු වී, එකිනෙකා හා ලැබුණු ආලෝකයන් සහ අත්දැකීම් බෙදා ගන්න. (විනාඩි 15 ක් පමණ)

**වෙනත් අයැදීම්වලට විශේෂ යොමුව:**
සුබැඳි. සබැඳි. සුරැඳි, සුමැදි සහ ප්‍රබෝධයේ වැඩ පිළිවෙල වෙනුවෙන්
* වෙනත් අයැදීම් ......

**සතරවන සතිය** - දිව්‍යමය කියවීම - හෙබ්‍රෙව් 12:1-13

**අයැදීමට විශේෂ යොමුව** - දේශය වෙනුවෙන් (විනාඩි 20 ක් පමණ)

වෙනත් අයැදීම්:
* අයැදීම් එකතුවලට අයත් සියලු දෙනා වෙනුවෙන්
* පුබුදු ජීවිතයෙන් ඈත්වූ සියලු දෙනා වෙනුවෙන්
* ක්‍රිස්තුදාන වැඩ පිළිවෙල සහ දුරස්තර ප්‍රදේශවල දිව්‍ය පූජාවකටවත් සහභාගි වීමට නොහැකි ජනතාව වෙනුවෙන්
* වෙනත් අයැදීම්

**"නිතරම ප්‍රීති වන්න**
**නොකඩවා යාච්ඤා කරන්න.**
**සියල්ලෙහිදී ස්තුති දෙන්න."**
- 1තෙසලෝනික 5:17

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -